No. NB/10/30/සමත මුදල් / විවිධ/2014

Nos. 2889488
2889489

2889491

info@rgd.gov.lk
rg@rgd.gov.lk

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## பதிவாளர் நாயகத் திணைக்களம்
## REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.rgdept.lk / www.rgd.gov.lk

දිනය / திகதி / Date: 2014.09.22

චක්‍රලේඛ අංක - 7/2014

කළාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වරුන් වෙත,

**<u>ඔප්පු වලට අලවා ඇති අඩු මුද්දර ගාස්තු හා හිග දඩ මුදල් අය කර ගැනිම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් අමතන ලද රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අංක RG/NB/01/චක්‍රලේඛ හා 2014/03/03 දින දරණ අංක 2/2014 චක්‍රලේඛයට අමතර වශයෙනි.

02 එකි චක්‍රලේඛ ලිපිය මගින් දක්වා ඇති කරුණු මත සමත මුදල් අය කිරිමේදි එකි විධිහිනතා වාර්තා ඉදිරිපත් කර ඇත්තේ මාසික වාර්තා ඒ ඒ මාස වල නියමිත පරිදි භාර දි තිබියදි පසුව ප්‍රමාද වි භාර දෙන දෙවන පිටපත් සම්බන්ධයෙන් වන්නේ නම් කාළය හෝ විධිහිනතා ප්‍රමාණය නොසළකා රු- 1000/- ක සමත මුදලක් පමණක් අය කිරිමට පියවර ගන්නන.

03 එසේම එකි දෙවන පිටපත් වලට මුද්දර ගාස්තු නියමිත වේලාව තුල ගෙවා නොමැති නම් මාගේ 02/2014 චක්‍රලේඛයේ සඳහන් පරිදි එකි දෙවන පිටපත් අදාල පළාත් අදායම් කොමසාරිස්වරුන් වෙත දන්වා යවා දඩ අය කර ගැනිමට ක්‍රියා කිරිමට උපදෙස් දෙන්න.

අත්/කලේ - ටී.එම්.ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට
රංජිත් ද්‍රණසේන
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් - 1) ලේකම්,රාජළා පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
2) විගණකාධිපති
3) සියළුම පළාත් අදායම් කොමසාරිවරුන් වෙත
4) ප්‍රධාන ගණකාධිකාරි

} දැන ගැනිම හා අවශ්‍ය කටයුතු සඳහා

RG/ND/01/වතුලේඛ

2014.02.01

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්,

<u>ඔප්පු වලට අලවා ඇති අඩු මුද්දර ගාස්තු සහ හිඟ දඩ මුදල් අය කර ගැනීම.</u>

නොතාරිස්වරුන් විසින් බදු සහ උකස් වලට අදාල ඔප්පු ලියා සහතික කිරීමේදී නියමිත මුද්දර ගාස්තුව 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනතේ 6(1) වගන්තියට අනුව එකී ඔප්පුව ලියා සහතික කිරීමට පෙර හෝ ලියා අත්සන් කරන වේලාවේදී ගෙවිය යුතු බවට සඳහන් වේ. එහෙත් මෙම මුද්දර ඇලවීම නිසි පරිදි නියමිත වේලාවට සිදු නොවන බව නිරීක්ෂණය විය. බොහෝ විට නොතාරිස්වරුන් ලියා සහතික කරන උකස් හා බදු වලට අදාල ඔප්පු දෙවන පිටපත් භාරදීම පුරුද්දක් වශයෙන් ප්‍රමාද කර පසුව මුද්දර අලවා දෙවන පිටපත් භාරදෙනු ලබන බව ද නිරීක්ෂණය විය. එබැවින් රජයට අය විය යුතු ආදායම නියමිත කලට වේලාවට නොලැබී යන බව නිරීක්ෂණය කරමි.

02. මෙම තත්වය සැලකිල්ලට ගෙන රජයට අය විය යුතු මුද්දර ගාස්තු නියමිත කාලය තුළ දී අය කර ගැනීමට හැකි වන පරිදි, පහත සඳහන් යෝජනා ඔබ වෙත ඉදිරිපත් කරමි.

I. උකස් හා බදු ඔප්පු වල දෙවන පිටපතට ඇලවිය යුතු මුද්දර වෙනුවට නියමිත ගාස්තුව බැංකුව වෙත ගෙවීමට ක්‍රම වේදයක් සකස් කිරීම.

II. එසේ බැංකුව වෙත මුදල් ගෙවීමේදී නිශ්චිත දින ගණනක් නියම කර ඉන් ප්‍රමාද වන සෑම දිනයක් වෙනුවෙන්ම දඩ මුදලක්බැංකුව මගින්ම ලබා ගැනීමට ක්‍රම වේදයක් සකස් කිරීම .

03. මේ සම්බන්ධයෙන් ඔබ ගනු ලබන ක්‍රියා මාර්ගය මා වෙත දන්වන මෙන් කාරුණිකව ඉල්ලමි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්

රංජිත් දයානන්ද
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :

1. ලේකම්, රාජ්‍ය පරි. හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැන ගැනීම සඳහා
2. විගණකාධිපති - දැන ගැනීම සඳහා
3. සියළුම පළාත් ආදායම් කොමසාරිස්වරුන්-දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
4. ප්‍රධාන ගණකාධිකාරී - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
5. සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් -දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා

**RG/NB/01/චක්‍රලේඛ**

2014.11. 10

සියලුම පළාත් ආදායම් කොමසාරිස්වරුන් වෙත,

<u>**ඔප්පුවලට අලවා ඇති අඩු මුද්දර ගාස්තු හා හිඟ දඩ මුදල් අයකර ගැනීම.**</u>

ඉහත කාරණය සම්බන්ධයෙන් ඔබටද පිටපතක් සහිතව සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් අමතා යවන ලද මගේ සමාංක හා 2013.12.31 දින දරණ අංක 15/2013 චක්‍රලේඛයේ 2:5 ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඔබ බලප්‍රදේශයට අයත් නොතාරිස්වරුන් විසින් ලියා සහතික කරන ලද ඔප්පු වලට අදාල හිඟ සහ දඩ මුදල් අයකිරීමට අදාල විස්තර ඔබ වෙත සපයා ඇති බව ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් මා වෙත වාර්තා කර ඇත.

03.ඒ අනුව ඔබ විසින් ඒ සම්බන්ධයෙන් ක්‍රියාකර අය කරනු ලබන හිඟ දඩ මුදල් පිළිබඳ විස්තර ඉහත ලිපියේ දක්වා ඇති ආදර්ශයට අනුවමාසිකව සකස් කර සෑම මසකම 10 වැනිදාට පෙර ඒ ඒ ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත දන්වා යවන මෙන් කාරුණිකව ඉල්ලමි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට

[illegible]
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:

01. ජනාධිපති ලේකම් - ජනාධිපති කාර්යාලය - ඔබේ අංක 513/2/1/43/1 හා 2013.12.09 ලිපිය අනුව දැනගැනීම සඳහා

02. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැනගැනීම සඳහා

03. විගණකාධිපති - දැනගැනීම සඳහා

04. සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර්වරුන් වෙත - දැනගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා

05. RG/NB/2/9 ගොනුවට- ඉහත සඳහන් ඡේදය අනුව වාර්තා පවත්වාගෙන යාම සඳහා

RG/NB/01/චක්‍රලේඛ


2889488
2889489

2889491

info@rgd.gov.lk
rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகத் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.rgdept.lk, www.rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.


දිනය / திகதி / Date: 2014.11.10

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

<u>ඔප්පුවලට අලවා ඇති අඩු මුද්දර ගාස්තු හා හිඟ දඩ මුදල් අයකර ගැනීම.</u>

ඉහත කාරණය සම්බන්ධයෙන් එවා ඇති මගේ සමාංක හා 2013.12.31 දින දරණ අංක 15/2013 චක්‍රලේඛය වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02.ඒ අනුව අය කරන ලද හිඟ මුද්දර ගාස්තු සහ දඩ මුදල් පිළිබඳ විස්තර සපයා ඇති ආදර්ශයට අනුව සකස් කර සෑම මසකම 10 වැනිදාට පෙර සියලුම පළාත් ආදායම් කොමසාරිස්වරුන් වෙත යැවිය යුතු අතර එහි පිටපතක් ප්‍රධාන කාර්යාලයේ ගණකාධිකාරි වෙත එවිය යුතු බවට එකී ලිපියෙන් උපදෙස් දී ඇත. ඊට අමතරව එම වාර්තාවේ පිටපතක් ප්‍රධාන කාර්යාලයේ නොතාරිස් අංශය වෙතද එවීමට පියවර ගන්න.

03. පෙර සඳහන් චක්‍රලේඛයේ උපදෙස් පරිදි පළාත් ආදායම් කොමසාරිස්වරුන් විසින් චක්‍රලේඛයේ 2:4 ඡේදයෙහි සඳහන් ආදර්ශයට අනුව හිඟ ආදායම් අයකරගත් මුදල් පිළිබඳ විස්තර ඔබ කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන ලේඛනවල නිසි පරිදි සටහන්කල යුතුය. එසේ අයකරගත් මුදල් පිළිබඳ විස්තර RG/NB/2/9/2012 හා 2012/06/28 දරණ ලිපියේ සඳහන් සාරාංශය මඟින් මා වෙත වාර්තා කල යුතුය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට

රංජිත් දයානන්ද
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:

01. ජනාධිපති ලේකම් - ජනාධිපති කාර්යාලය - ඔබේ අංක 513/2/1/43/1 හා 2013.12.09 ලිපිය අනුව දැනගැනීම සඳහා
02. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැනගැනීම සඳහා
03. විගණකාධිපති - දැනගැනීම සඳහා
04. සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර්වරුන් වෙත - දැනගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා
05. RG/NB/2/9 ගොනුවට- ඉහත සඳහන් ඡේදය අනුව වාර්තා පවත්වාගෙන යාම සඳහා

RG/NB/1/21

2014.11.24

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

<u>ඔප්පුවලට අලවා ඇති අඩුමුද්දර ගාස්තු හා හිඟ දඩමුදල් අයකිරීම</u>

01. ප්‍රසිද්ධ නොතාරිස්වරුන් විසින් ලියා සහතික කරනු ලබන ඔප්පුවලට අදාලව දෙවන පිටපත් වලට සැපයිය යුතු මුද්දර ගාස්තු අඩුවෙන් සැපයීම හෝ සම්පූර්ණයෙන් නොගෙවීම හේතුවෙන් රජයට විශාල මුදලක් අහිමි වී ඇති බවට කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් ජනාධිපති විමර්ශණ ඒකකය විසින් කාර්යාල කිහිපයක් විමර්ශණයට භාජනය කර අදාල වාර්තා ජනාධිපති ලේකම්ගේ අංක SB/2/1/43/1 සහ 2013.12.09 දින ලිපිය මඟින් මා වෙත එවා තිබුණි.

02. එකී වාර්තා පදනම් කරගෙන රජයට අයවිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල කිහිපයක් පරීක්ෂා කරවන ලද අතර,ඒ අනුව ලබා දුන් වාර්තාව පරීක්ෂා කිරීමේදී, සමහර කාර්යාලවල අනුබද්ධිත නොතාරිස්වරුන්ට පනවා ඇති හිඟ සහ දඩමුදල් නිසි පරිදි අයවීමක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.මේ සම්බන්ධයෙන් මවිසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීමෙන් හෝ ප්‍රමාද කිරීමෙන් දෙවන පිටපත් මත රජයට අයවිය යුතු මුදල් අයකරගැනීම ප්‍රමාද වීම කඩිනමින් යතාවත් කරගැනීමට කටයුතු කළ යුතුව ඇත.

03. මෙ පිළිබඳව ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරවන අතර හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් අයකිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2012.06.28, 2013.01.09, 2013.12.31 සහ 2014.11.10 චක්‍රලේඛ වල සඳහන් උපදෙස් අනුව ක්‍රියා කරමින් රජයට අයවිය යුතු හිඟ සහ දඩමුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කරන ලෙස වැඩි දුරටත් දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්
ඊ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්-

01.ජනාධිපති ලේකම්-ජනාධිපති කාර්යාලය - ඔබේ අංක SB /2/1/43/1 හා 2013.12.09 ලිපිය අනුව දැනගැනීම සඳහා
02.ලේකම් ,රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැනගැනීම සඳහා
03.විගණකාධිපති - දැනගැනීම සඳහා
04.සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වරුන් වෙත - දැනගැනීමට හා අවශ්‍ය කයයුතු සඳහා
05.RG/NB/2/9 ගොනුවට - දැනගැනීමට හා අවශ්‍ය කයයුතු සඳහා
06. RG/NB/1/චක්‍රලේඛ ගොනුවට